# ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ගෘහ කුටුම්භයන්හි ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන සාධක

ජී.ආර්. මදුෂාණි[1]

**සංක්ෂේපය**

විශ්වීය වශයෙන් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම වර්තමානයේ දී සමස්ත ලෝක වාසීන්ගේම පොදු අරමුණක් බවට පත්ව ඇත. එය ජාත්‍යන්තර මට්ටමින්, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් මෙන්ම කුටුම්භ මට්ටමින්ද නිරතුරු දැඩි අවධානයට ලක් වේ. ඕනෑම සමාජ මට්ටමක වූ ග්‍රාමීය හා නාගරික වශයෙන් වූ විභේදනය තුල ආහාර සුරක්ෂිතතාවයෙහි පැහැදිලි වෙනසක් හඳුනාගත හැකිය. එනිසා එම විභේදනය තුල ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන සමාජ හා ආර්ථික සාධකයන් වෙනසක් පවතීද යන්නත්, එලෙස වෙනසක් පවතී නම් ඒ සඳහා බලපාන සාධක හඳුනාගනිමින් ඒ සඳහා විසඳුම් යෝජනා කිරීමත් මෙහි අරමුණ විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා නාගරික අංශයන්හි ගෘහ කුටුම්භවල ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන සමාජ හා ආර්ථික සාධකයන් අතරෙහි වෙනසක් පවතීද යන්න ගැටලුව ලෙස යොදා ගනිමින් අධ්‍යයනය සිදු කෙරිණි. ආහාර නිෂ්පාදනය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක් ග්‍රාමීය අංශයෙන් දායාද වුවද ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල අනාරක්ෂිතතාවයෙන් සහ කුසගින්නෙන් පෙළෙන බහුතරය ග්‍රාමීය අංශය නියෝජනය කරන අතර ඔවුන් ආර්ථිකමය වශයෙන් පහල මට්ටමක පැවතීම නිසා ආහාර සුරක්ෂිතතාවය අභියෝගයට ලක් වුවද, නාගරික අංශයේ ආහාර සුරක්ෂිතතාවයද අභියෝගයට ලක් වන අවස්ථා පවතී. එය ආදායම් මට්ටම පමණක්ම මත සිදුවන්නක් නොවන බව පැහැදිලි වේ. ඒ අනුව ග්‍රාමීය හා නාගරික අංශ ලෙස පිළිවෙලින් හම්බන්තොට දිස්ත්‍රික්කය සහ ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින් ඔවුන්ගේ සමාජ ආර්ථික දත්තයන් මත පදනම් වෙමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. දත්ත විස්තරාත්මක ක්‍රමවේදය සහ කයිවර්ග පරීක්ෂාව යටතේ විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයන ප්‍රතිඵලයන්ට අනුව නාගරික හා ග්‍රාමීය අංශවල කුටුම්භයන්හි කුටුම්භයේ මුළු මාසික ආදායම, ජනගහන ව්‍යාප්තිය, පෞද්ගලික ඉඩම් ප්‍රමාණය, ආහාර හෝ වෙනත් සහනාධාර වල හිමිකම, කාන්තා අධ්‍යාපන මට්ටම (කුටුම්භය තුළ මවගේ හෝ බිරිඳගේ), නිවසින් පිටත ආහාර පරිභෝජනය, කුටුම්භයේ සෞඛ්‍යය තත්ත්වය, කුටුම්භයේ පරිභෝජන අවශ්‍යතාවන් කුටුම්භය තුළින්ම සපුරා ගැනීමේ ස්වභාවය, කුටුම්භයේ ආහාර විවිධාංගීකරණයේ ස්වරූපය, කුටුම්භයේ ආහාර අවශ්‍යතාවය ප්‍රමාණාත්මකව ලැබී ඇති/නැති බව ජාතික සැලසුම් හා ප්‍රතිපත්තිවල

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය.
madushanigrk@gmail.com

බලපෑම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විෂමතාවන් යනාදී වූ සමාජීය හා ආර්ථික සාධක ආහාර සුරක්ෂිතතාව සඳහා බලපා ඇති බව හඳුනා ගත හැකි විය.

**මුඛ්‍ය පද ඃ** *ආහාර සුරක්ෂිතතාවය, සමාජීය සාධක, ආර්ථික සාධක*